සබරගමු අධ්‍යාපන දෙපාර්තුමේන්තුව **Covid 19**-සති පාසල් වැඩසටහන

**නර්තන විෂය / 12 දෙවන වාරය ගැමි නැටුම් - (3 ) කාර්ය පත්‍රිකාව - (2020.05.11 - 2020.05.15 )**

**ණිපුනණතාව - රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක් කරයි.**

**ණිපුනණතා මට්ටම- නිර්දේශිත සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරයි.**

**<u>සියලුම ප්‍රශ්න වලට නිවැරිදි පිළිතුර තෝරන්න.</u>**

1. ගැමි නැටුමක විශේෂ ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකිය.

1.සරල බව හා සාම්ප්‍රදායික බව 2. ශාස්ත්‍රීය බව හා උපකරණ භාවිතය3. සරල බව හා උපකරණ භාවිතය

2. ලී කෙලි නැටුමක කැටයමක් සහිත රූකම් මාලාවක් දක්නට ඇත්තේ

1.ගඩලාදෙනිය විහාරයේ 2.ලංකාතිලක විහාරයේ 3.ගලපාත විහාරයේ 4.ඇම්බැක්ක දේවාලයේ

3. ශ්‍රී ලංකාවේ ගැමි නැටුම් සඳහා මෙම උපකරණ භාවිතා කරයි.

1. ලී , කඩු ,පතුරු 2. පතුරු, කුලු, පන්තේරු 3. පතුරු,කුලු , උඩැක්කි. 4. කළ. තාලම්, ගිගිරි

4. යුද්ධ අභ්‍යාස මුල්කර ගනිමින් නිර්මානය වූ නැටුමකි.

1 පතුරු නැටුම 2. ලී කෙලි නැටුම 3. සවරන් නැටුම 4. පන්තේරු නැටුම

5.වර්තමානයේ කර්මාන්ත ආශ්‍රිතව නිර්මානය වු ගැමි නැටුමක් නොවන්නේ

1.කුලු නැටුම 2. ගොයම් නැටුම 3. මෝල්ගස් නැටුම 4. පතුරු නැටුම

**<u>හිස්තැනට සුදුසු පිළිතුර යොදන්න.</u>**

6. සිංහල ගැමි නැටුම් ගත් කල සැම විටම ත්‍රිවිධ රත්නයෙන් හා-------------- අවසර ගත් බව කවි වලින් පැහැදිලි වේ.

7.ලි කෙලි නැටුමේ ලී දෙක සඳහා වඩාත් සුදුසු වන්නේ ------------ ලීයයි.

8. කමත් භාෂාවේදි කුල්ලට කියන තවත් නමකි .---------------

9. කළ ගෙඩි නැටුම සඳහා ------------ එන කවි භාවිතා කරයි.

10.--------- නැටුම ආචාර්ය එස් පණිභාරත මහතා නිර්මාණය කල ගැමි නැටුමකි.

**<u>රචනාමය ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.</u>**

1.දේශීය ගැමි නැටුම් යනු කුමක්දැයි හඳුන්වා, ගැමි නැටුමෙහි දක්නට ලැබෙන සුවිශේෂතා හඳුන්වා දෙන්න.

2,ගැමි නැටුමකින් ප්‍රතීයමාන වන තොරතුරු එම නර්තන නිර්මාණයට බලපාන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.

3.ගැමි නැටුමට ආවේනික සුවිශේෂලක්ෂණ මෙන්ම ඒ හා බැඳි ගායනා වලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹු වේ.විග්‍රහ කරන්න

**සැකසුම - එච්. අයි. නිලකාන්ති. (ර.සුමනා බාලිකා විද්‍යාලය)**